SINHALESE

පවුල් දිවා රැකවරණ තත්ව තහවුරුව

**Family Day Care Quality Assurance**

# Handbook

# අත් පොත



Second Edition 2004

National Childcare Accreditation Council

© ඕස්ට්‍රේලියානු රජය 2004

ISBN 0-9750664-4-7

සියළු හිමිකම් ඇවිරිණි. 1968 හිමිකම් ඇවිරීම් පනත (Copyright Act 1968) යටතේ ඇති ඉඩකඩ සහ/හෝ ප්‍රකාශක විසින් අරමුණු කරගත් කාර්‍යයන් හැරුණු විට National Childcare Accreditation Council මගින් ලබාගත් පූර්ව ලිඛිත අවසරය නොමැතිව මෙහි කිසිදු කොටසක් නැවත ප්‍රකාශයට පත්කල නොහැක.

National Childcare Accreditation Council Inc. මගින් සකසන ලදී.

National Childcare Accreditation Council Inc. මගින් ප්‍රකාශයට පත් කරන ලදී.
Level 3, 418a Elizabeth Street, Surry Hills NSW 2010, Australia (http://www.ncac.gov.au).

# පටුන


හැඳින්වීම ... 3

ගුණාත්මක ළමා රැකවරණ යනු කුමක්ද? ... 4

ළමා රැකවරණවලදී ගුණාත්මකභාවය වැදගත් වන්නේ කුමක් නිසාද? ... 4

පවුල් ළමා දිවා රැකවරණ තත්ව තහවුරුව (Family Day Care Quality Assurance (FDCQA) ) වර්ධනයවීම ... 5

FDCQA ප්‍රකාශන ... 5

ගුණාත්මක ක්ෂේත්‍රයන් 6 සහ මූලධර්ම 30 ... 6

FDCQA ක්‍රියාවලිය ... 8

ප්‍රතිත සඳහා අවශ්‍ය සම්මතයන් ... 10

අඛණ්ඩ වර්ධන චක්‍රය ... 10

ප්‍රතිත තීරණ සමාලෝචන කමිටුව (The Accreditation Decisions Review Committee (ADRC)) ... 11

ළමා රැකවරණ ප්‍රතිලාභ (Child Care Benefit) සඳහා අරමුදල් සම්පාදනය සහ FDCQA හි සෑහීමට පත්විය හැකි සහභාගිත්වය සහ අභිවෘද්ධිය ... 11

FDCQA සහ බලපත්‍ර සම්බන්ධ ව්‍යවස්ථා ... 11

FDCQA සහ පවුල් දිවා රැකවරණ වැඩ සටහන් (Schemes) සම්බන්ධයෙන් National Childcare Accreditation Council වෙත ලැබෙන පැමිණිලි ... 12

National Childcare Accreditation Council සම්බන්ධව ... 12

තවත් තොරතුරු ... 12

# හැඳින්වීම

ළමුන්ගේ ඉගෙනීම සහ වර්ධනය දියුණු වන ඔවුන්ගේ තීරණාත්මක මුල් අවුරුදුවලදී ඕස්ට්‍රේලියාව පුරා ඉතා උසස් මට්ටමක රැකවරණ සලසා දීම පවුල් දිවා රැකවරණ තත්ව තහවුරුව (Family Day Care Quality Assurance (FDCQA)) මගින් ඉලක්ක කෙරේ. FDCQA හි පුළුල් අරමුණු වන්නේ පවුල් දිවා රැකවරණවල සිටින දරුවන් හට ඔවුන්ගේ වර්ධනයේ සියළුම අංශ පෝෂණය කල හැකි ප්‍රබෝධජනක සහ ප්‍රත්‍යක්ෂ අත්දැකීම් සහ අන්තර ක්‍රියාවන් ඇති බවට වග බලා ගැනීමයි. මෙය සිදු කරන්නේ පවුල් දිවා රැකවරණයේ ගුණාත්මකභාවය අර්ථ දැක්වීම මගින්, වැඩ සටහන (scheme) මගින් සපයන රැකවරණයෙහි ගුණාත්මකභාවය මැනීමට ක්‍රමයක් සැපයීම සහ අඛණ්ඩ ලෙස පවතින ගුණාත්මකභාවය වර්ධනය කල හැකි ක්ෂේත්‍රයන් හඳුනා ගැනීම මගින්ය.

FDCQA යනු ළමා රැකවරණ ප්‍රතිලාභ (Child Care Benefit) සහ පවුල් දිවා රැකවරණ වැඩ සටහන් (schemes) සඳහා ක්‍රියාකාරී සහාය (Operational Assistance) අනුමැතිය හා සම්බන්ධවුනු ඕස්ට්‍රේලියානු රජය විසින් ආරම්භ කරන ලද්දකි[1]. 2001 ජුලි 1 දින ආරම්භයත් සමගම FDCQA පරිපාලනය කරන ලද්දේ National Childcare Accreditation Council Inc (NCAC) මගිනි.

ළමුන්ට සලසන සේවා ප්‍රතිත කරන ස්වේච්ඡා ක්‍රම වෙනත් රටවල තිබුණද, ජාත්‍යන්තර තලයේදී ඕස්ට්‍රේලියානු FDCQA අද්විතීය ස්ථානයක් හිමිකර ගනී. හේතුව වන්නේ ව්‍යවස්ථා මගින් ළමා රැකවරණ සඳහා අරමුදල් සැපයීම සහ ෆෙඩරල් රජයක් මගින් අරමුදල් සැපයීමත් සහාය ලබාදීමත් සිදු කරන පවුල් දිවා රැකවරණ සේවා සඳහා වන ලොව ප්‍රථම තත්ව තහවුරු වැඩ සටහන මෙය වීමයි. ඕස්ට්‍රේලියානු දිගු දිවා රැකවරණ මධ්‍යස්ථාන සහ පාසැල් වේලාවෙන් පිටත රැකවරණ සේවා සම්බන්ධයෙන්ද සාර්ථක ලෙස තත්ව තහවුරු ක්‍රම ක්‍රියාත්මකවේ[2]. පවුල් දිවා රැකවරණ සඳහා FDCQA ප්‍රතිශෝධනය කිරීම මගින් සිය දරුවන්ගේ රැකවරණ සඳහා ඇති තේරීම් කරන අතර පවුල් සඳහා ඇති තොරතුරු පරාසය පුළුල් කෙරේ.

වර්තමානයේ ගුණාත්මක දිවා රැකවරණ පරිචයන් සහ පවුල් දිවා රැකවරණ සහ වෙනත් පෙර ළමා විය ක්ෂේත්‍රයන් ලෙස හඳුන්වනු ලබන කරුණු හා සම්බන්ධව කරන ලද පුළුල් පරාසයක තොරතුරු රැස්කිරීම් මගින් ලබාගත් පර්යේෂණ සහ අත්දැකීම් මත FDCQA පදනම්වී ඇත. *FDCQA Quality Practices Guide* (ගුණාත්මක පරිච මාර්ගෝපදේශය) මගින් ගුණාත්මක ක්ෂේත්‍රයන් 6 ක් සහ තත්ව රැකවරණ මූලධර්ම 30 ක් දක්වයි. පවුල් දිවා රැකවරණ වැඩ සටහන් (schemes) පරිචයන් හට මග පෙන්වීම සඳහා ගුණාත්මක දර්ශකයන්ද මෙයට ඇතුලත් කර ඇත.

---

1 FDCQA හි අරමුණු සඳහා, වැඩ සටහන (scheme) යන්නට රැකබලා ගන්නන්, සම්බන්ධීකරණ ඒකක කාර්ය මණ්ඩලය සහ කළමණාකරණය ඇතුලත්වේ

2 පාසැල් වේලාවෙන් පිටත රැකවරණ සේවා සඳහා පාසැල් වේලාවෙන් පිටත රැකවරණ තත්ව තහවුරුව (Outside School Hours Care Quality Assurance (OSHCQA)) සහ දීර්ඝ දිවා රැකවරණ මධ්‍යස්ථාන සඳහා තත්ව වර්ධන සහ ප්‍රතිත ක්‍රම (Quality Improvement and Accreditation System (QIAS))

## ගුණාත්මක ළමා රැකවරණ යනු කුමක්ද?

ගුණාත්මක ළමා රැකවරණ සේවා මගින් හුදෙක් ළමා <u>රැකවරණ</u> ලබා දීම පමණක් සිදු නොකෙරේ - ගුණාත්මක ළමා දිවා රැකවරණ මගින් රැකබලා ගන්නන්, ළමුන් සහ ඔවුන්ගේ පවුල් අතර ප්‍රත්‍යක්ෂ සම්බන්ධතාවයක් වර්ධනය කෙරේ. ඒ මගින් ළමුන්ගේ සිතීමේ සහ භාෂාමය හැකියාවන් පුළුල් කර ගැනීමටත්, ඉගෙනීමට සහ වර්ධනය වීමට උපකාරීවන අත්දැකීම් ලබාදේ.

**හොඳ තත්වයේ පවුල් දිවා රැකවරණ වැඩ සටහනක් (scheme):**

- වැඩ සටහනේ (scheme) සියළුම ක්‍රියාකාරීත්වයන් සඳහා මග පෙන්වන රැකබලා ගන්නන්, කාර්ය මණ්ඩලය, කළමණාකරණය සහ පවුල් විසින් එකඟවූ පැහැදිලි දර්ශනයක් සහ අරමුණු ඇත,
- විවිධ පසුබිම්වලින් පැමිණෙන සහ අමතර අවශ්‍යතාවයන් ඇති ළමුන් ඇතුළුව සියළුම ළමුන්ගේ පෞද්ගලිකත්වය සහ අන්තර්රැඳියාව අගය කිරීමත්, ගරුකිරීම වර්ධනය කිරීමත් සිදු කෙරේ,
- ළමුන්ගේ වර්ධනයට බලපාන සියළුම අත්දැකීම් සහ ක්‍රියාකාරකම්හි යෝග්‍යතාව සැලකිල්ලට ගනු ලැබේ, තවද
- වැඩ සටහන (scheme) හා සම්බන්ධවීමට පවුල් උනන්දු කරන අතර රැකබලා ගන්නන්, කාර්ය මණ්ඩලය සහ පවුල් අතර සම්බන්ධතාවය පෝෂණය කිරීම මගින් ඔවුන් එකිනෙකා හට සහාය ලබා දිය හැක.

ළමුන් ඉගෙන ගන්නේ සහ වර්ධනය වන්නේ කෙසේද යන්න ඇතුළු පෙර ළමා විය සම්බන්ධ පැහැදිලි දැනීමක් මත ගුණාත්මක රැකවරණ පදනම්වී ඇත. හොඳම රැකවරණය ලබාදෙන රැකබලා ගන්නන්, විවිධ වයස්වල ළමුන්හට යෝග්‍ය අත්දැකීම් සහ ඔවුන්ගේ අපේක්ෂාවන් මොනවාද යන්න හඳුනා ගන්නා අතර පුද්ගල සහ සංස්කෘතික වර්ධනයේ පරිමාණයන් සම්බන්ධව සංවේදීවේ. එවැනි රැකවරණ සපයන්නන් හට, සන්නිවේදනය කරන්නේ කෙසේද යන්න සහ ළමුන් සමග විශේෂ සම්බන්ධතාවයක් වර්ධනය කර ගන්නේ කෙසේද යන්න පිළිබඳ අවබෝධයක් ඇත. එක් එක් දරුවාගේ පුද්ගලික උනන්දුව සහ අවශ්‍යතාවය අනුව ප්‍රබෝධිත සැලසුම් සහිත සහ නිරායාස අත්දැකීම් අතර සමතුලිතතාවයක් සහ ක්‍රියාශීලී සහ විවේක කාලයන් අතර සමතුලිතතාවයක් ඇති පරිසරයක් ඔවුන් විසින් නිර්මාණය කරනු ලැබේ.

ගුණාත්මකභාවය වර්ධනය කිරීම, වැඩ සටහනේ (scheme) සියළුම සාමාජිකයන් සහභාගිවන සහයෝගාත්මක ක්‍රියාවලියකි. සිය ඌණ පූරණ කාර්යයෙහිලා එකමුතුව ක්‍රියාකර, දර්ශනයක් අර්ථ නිරූපණය කිරීමටත්, ළමුනට යෝග්‍ය අත්දැකීම්, අන්තර්ක්‍රියා දක්වන ආකාරය සහ වැඩ සටහනේ (scheme) අනෙක් සියළුම ක්‍රියාකාරකම් සඳහා මග පෙන්වීමටත්, FDCQA මගින් එක් එක් වැඩ සටහන්ද (scheme) එවායේ නිරත වන පවුල්ද උනන්දු කෙරේ.

FDCQA හි සහභාගිවීමට NCAC සමග ලියාපදිංචිවී ඇති සියළු පවුල් දිවා රැකවරණ වැඩ සටහන් (scheme) අඛණ්ඩ ගුණාත්මක වර්ධන සඳහා විධිමත් ක්‍රියාවලීන් ක්‍රියාත්මක කිරීම අවශ්‍යය. මෙය ඉතාම හොඳින් සිදුකල හැක්කේ කෙසේද යන්න එක් එක් වැඩ සටහන (scheme) විසින් නිර්ණය කල හැකි අතර NCAC අවශ්‍යතාවයන්ට අනුව වැඩ සටහන් (schemes) විසින් පහත දැක්වෙන කරුණු ප්‍රදර්ශනය කල යුතුව ඇත ඃ

(a) අඛණ්ඩ ගුණාත්මක වර්ධන සඳහා ක්‍රමානුකූල ක්‍රියාවලීන් ඇති බව; සහ

(b) *FDCQA* තත්ව පරිච මාර්ගෝපදේශය (*Quality Practices Guide* (2004))හි දක්වා ඇති විධිමත් ස්වයං තක්සේරු ප්‍රමිතීන් හා මෙම ක්‍රියාවලීන් අනුකූලවීම.

## ළමා රැකවරණවලදී ගුණාත්මකභාවය වැදගත් වන්නේ කුමක් නිසාද?

මව්පියන් දෙදෙනාම වැඩ කරන හෝ තනි මව් පිය අවස්ථාවලදී එකී තනි මව හෝ පියා වැඩ කරන පවුල් සංඛ්‍යාව වැඩිවීමත් සමගම උපතේ සිට ප්‍රාථමික පාසැල් අවධිය පුරා නිවසින් පිටතදී දරුවන් බලා ගැනීම මෑත කාලීනව සීඝ්‍ර ලෙස වර්ධනයවී ඇත. ඕස්ට්‍රේලියාවේ පවුල්වල, වැඩ හා සම්බන්ධ සහ වැඩ හා සම්බන්ධ නොවන රැකවරණ ඇතුළු වෙනස්වන සහ විවිධ අවශ්‍යතා මගින් ළමා රැකවරණ සේවාවල වැඩිවී ඇති ඉල්ලුම නිරූපණයවේ. එක් ළමයකු රැකවරණවල ගතකරන සාමාන්‍ය කාලය සැලකිය යුතු මට්ටමකින් ඉහල ගොස් ඇත. ඉතා කුඩා දරුවකු පාසැල් යාම ඇරඹීමට පෙර පැය 12,500 තෙක් ළමා රැකවරණවල ගත කල හැක. මෙය ළමයා සිය වසර 13 පාසැල් ජීවිතය පුරාම පාඩම් සඳහා ගතකරන කාලයට වඩා අඩුවන්නේ පැය 500 කින් පමණි[3].

ළමුන්ගේ අනාගතය හැඩගැස්වීමේදී විශේෂයෙන් ඔවුන්ගේ ජීවිතයේ ප්‍රථම වසර කිහිපය තුල ඔවුන් හට ලැබෙන රැකවරණවල තත්වය, ඔවුන්ගේ ඉගෙනීමේ අත්දැකීම් සහ සම්බන්ධතා ඉතා වැදගත්වේ. අප ජීවිතයේ මිනෑම වසර පහක කාල පරිච්ඡේදයකට වඩා ප්‍රථම වසර පහක කාල පරිච්ඡේදයේදී බොහෝ දේ ඉගෙන ගන්නා බව වර්තමානයේ ඇති පිලිගැනීමයි. මොළයේ වර්ධනය සම්බන්ධ පර්යේෂණවලින් පෙන්වා දී ඇත්තේ උසස් තත්වයේ ළමා රැකවරණ මගින් ලබාදෙන ආකාරයේ ජීවිතයේ මුල් කාලයේ ලැබෙන ප්‍රත්‍යක්ෂ අත්දැකීම් මගින් ළමුන්ගේ වර්ධනය දියුණු වන බවයි. ළමුන්ගේ ජීවිත කාලය පුරාම ඉගෙනීම සහ යම් යම් දේ ලබා ගැනීම දියුණු කිරීම මගින් වඩා ප්‍රත්‍යක්ෂ ජීවන අවස්ථාවන් සහ ප්‍රතිඵල සහ පසු කාලයේදී ඇතිවිය හැකි දුර්වල සෞඛ්‍යය තත්වයන් අඩු කිරීම සම්බන්ධයෙන් ගුණාත්මක ළමා රැකවරණ සේවා මගින් වඩා වැදගත් කාර්ය භාරයක් ඉටු කරයි.

කුඩා ළමුන් සම්බන්ධව අපගේ දැනුම වර්ධනයවීම; පවුල්වල වෙනස්වන සහ විවිධාකාර අවශ්‍යතා; ළමා රැකවරණවල සිටින ළමුන්ගේ සංඛ්‍යාව; සහ රැකවරණ සම්බන්ධයෙන් වැය කරනු ලබන කාලය මගින් ඕස්ට්‍රේලියාව පුරා ඇති පවුල් දිවා රැකවරණ වැඩ සටහන්වල (schemes) සිටින ළමුන් හට ඉතා ඉහල තත්වයේ රැකවරණ ලබාදීමේදී FDCQA හි ඇති වැදගත්කම අවධාරණයවේ. පවුල් දිවා රැකවරණ මගින් ළමුන් හට ගුණාත්මක රැකවරණ ලබා දෙන බවට දැනටමත් පිළිගෙන ඇති අතර, FDCQA ක්‍රමය මගින් අරමුණු කරන්නේ මෙම රැකවරණ ප්‍රතිත ක්‍රියාවලියක් මගින්

3ළමා රැකවරණඃ 50 (සති) x 50 (පැය) 5 x (අවුරුදු)=පැය 12,500 පාසැල් යාම ඃ 40 (සති) x 25 (පැය) x 13 (අවුරුදු) = පැය 13,000

පිලිගැනීමයි. FDCQA හි අවසාන අරමුණ වන්නේ ඕස්ට්‍රේලියාව පුරා පවුල් දිවා රැකවරණවල සිටින 93,450 ක් වන ළමුන් හට ගුණාත්මක වශයෙන් පරිපූර්ණ ප්‍රථිඵල ප්‍රවර්ධනය කිරීම සහ සහතික කිරීමය[4].

## පවුල් දිවා රැකවරණ තත්ව තහවුරුව (Family Day Care Quality Assurance) වර්ධනය

පවුල් දිවා රැකවරණ තත්ව තහවුරුව (Family Day Care Quality Assurance) පරිපාලනය කිරීමේ වගකීම 2001 ජුලි 1 දින සිට NCAC වෙත පැවරිණි. කෙසේවුවද FDCQA වර්ධනය කිරීම, 1990 මැද භාගයේ සිටම ඕස්ට්‍රේලියානු පවුල් දිවා රැකවරණ න්‍යාය පත්‍රයේ ඉහලින්ම පැවතිණි.

ඕස්ට්‍රේලියානු රජයේ පූර්ව මැතිවරණ 1996 පෙබරවාරි පවුල් සඳහා වන ස්ථිවරතා (*Certainty for Families*) ප්‍රතිපත්තිය මගින්, පවුල් දිවා රැකවරණ සඳහා තත්ව තහවුරුව සඳහා රජයේ කැපවීම ප්‍රකාශයට පත්කරන ලදී. මෙම කැපකිරීම මගින් ප්‍රාරම්භක කටයුතු සැලකිය යුතු ප්‍රමාණයක් ආරම්භ කරන ලදී. මෙම කාලයේදී, ප්‍රාන්ත රජයන් මගින් පවුල් දිවා රැකවරණ සඳහා බලපත්‍ර ලබාදීමේ කටයුතුද සිදු කරන ලදී. FDCQA වර්ධනය කිරීමේ වැදගත් සිදුවීම් අතර 1997 පවුල් දිවා රැකවරණ සඳහා ජාතික ප්‍රමිතීන් වර්ධනය කිරීම සහ 1998 පවුල් දිවා රැකවරණ සඳහා තත්ව තහවුරුව ආකෘති වර්ධනය කිරීමේ වගකීම ඇති, තත්ව තහවුරුව මත පවුල් දිවා රැකවරණ වැඩ කණ්ඩායමක් ස්ථාපනය කිරීම ආදිය ඇත.

2000 සහ 2001 වසරවලදී, තත්ව තහවුරු ක්‍රමයට සහාය දෙන ආකෘතිමය සහ ස්වයං ඇගයීමේ මෙවලමක් වර්ධනය කරන ලදී. යෝජිත තත්ව තහවුරු ක්‍රම ආකෘතිය සහ මෙවලම්හි හය මාස නියාමක වැඩ සටහනේ කොටසක් වශයෙන් ඕස්ට්‍රේලියාව පුරා පවුල් දිවා රැකවරණ වැඩ සටහන් (schemes) එකොලහක් ඇත. එක් එක් ප්‍රාන්තය විසින් නියාමක වැඩ සටහන නියෝජනය කරනු ලබන අතර ඒ මගින් පවුල් දිවා රැකවරණවල අද්විතීයබව සහ විවිධත්වය නියෝජනය වනු ඇත.

පවුල් දිවා රැකවරණ අංශය වෙත යෝජිත තත්ව තහවුරු ක්‍රමය සම්බන්ධව දැනුවත් කිරීමට සහ ක්‍රමය සම්බන්ධයෙන් අදහස් ලබා ගැනීමට ඕස්ට්‍රේලියානු රජයේ පවුල් සහ ප්‍රජා සේවා දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව 2001 මැයි සිට ඕස්ට්‍රේලියාව පුරා අදහස් විමසීමේ රැස්වීම් මාලාවක් පවත්වන ලදී.

2001 ජුලි සිට FDCQA ක්‍රියාත්මකවීමේ පටන්, මෙම ක්‍රමයේ සියළුම අංශ සම්බන්ධයෙන් පවුල් දිවා රැකවරණයේ නියුතු ප්‍රජාවගේ අදහස් NCAC විසින් ක්‍රියාකාරී ලෙස විමසමින් සිටී.

පවුල් දිවා රැකවරණ ප්‍රජාව විසින් ලබාදෙන ලද අදහස් FDCQA *Quality Practices Guide* (1st edition, 2001) සමාලෝචනය කිරීමේ කාරයාවලියේදී සැලකිය යුතු ආකාරයකින් දායක වී ඇත.

ඕස්ට්‍රේලියාවේ ජාතික පවුල් දිවා රැකවරණ කවුන්සිලයේ (National Family Day Care Council of Australia (NFDCCA)) අදහස් විමසීමෙන් අනතුරුව, පළමු ප්‍රකාශනය සමාලෝචනය කිරීම සඳහා NCAC කාර්‍ය මණ්ඩලය සමග කටයුතු කිරීමට පවුල් දිවා රැකවරණ සේවා සපයන්නන්ගෙ පරිශීලන කණ්ඩායමක් පත්කරන ලදී.

FDCQA *Quality Practices Guide* (2nd edition, 2004) සකස් කිරීමේදී NFDCCA සහ පරිශීලන කණ්ඩායම විසින් මෙම කාර්‍ය පහසු කිරීමට ලබා දුන් සහාය වෙනුවෙන් NCAC හි ස්තුතිය මෙයින් පල කෙරේ. දෙවෙනි ප්‍රකාශනය, පළමු ප්‍රකාශනයේ වැඩි දියුණු කිරීමක් ලෙසත්, කෙටි වසර ගණනාවක් තුල ක්ෂේත්‍රය අත්කරගත් ප්‍රගතිය සනිටුහන් කිරීමක් බවත් පවුල් දිවා රැකවරණ වැඩ සටහන් (schemes) විසින් පිලිගනු ලබන බවට NCAC විශ්වාසය පලකර සිටී.

FDCQA වර්ධනයන් සම්බන්ධ වැඩිදුර තොරතුරු සඳහා කරුණාකර FDCQA *Quality Practices Guide* (2004) හි පරිශිෂ්ඨය බලන්න.

## FDCQA ප්‍රකාශන

(2004) *FDCQA Handbook* මගින් FDCQA සම්බන්ධ සමාලෝචනයක් ලබාදෙන අතර *FDCQA Quality Practices Guide* (2004) සහ *FDCQA* ස්වයං අධ්‍යයන වාර්තා (2004) (*Self-study Report* (2004)) සඳහා සහයෝගී ප්‍රකාශයක්වේ. මෙම ප්‍රකාශනයන් සැලසුම් කර ඇත්තේ රැකවරණ පරිචයන්හි තත්ව වර්ධනයන් සැලසුම් කිරීමේ වැඩ සටහන්වලට (schemes) මග පෙන්වීම සහ සහාය ලබා දීමට සහ FDCQA හි වාර්තා කිරීමේ අවශ්‍යතා සපුරාලීමටත්ය. FDCQA හි සහභාගිවීමට ලියාපදිංචිවී ඇති පවුල් දිවා රැකවරණ වැඩ සටහන් (schemes) හට ආරම්භයේදී මෙම ප්‍රකාශනය ලබා දෙනු ඇත. මෙම ප්‍රකාශනයේ අමතර පිටපත්, NCAC වෙතින් ඍජුවම මිලදී ගත හැක, එසේ නැතිනම් NCAC වෙබ්අඩවියෙන්(www.ncac.gov.au) නොමිලේ ලබාගත හැක.

---

[4] ළමා රැකවරණ සේවා 2002 සංගණනය, පවුල් සහ ප්‍රජා සේවා දෙපාර්තමේන්තුව

# ගුණාත්මක ක්ෂේත්‍රයන් 6 සහ මූලධර්ම 30

## ගුණාත්මක ක්ෂේත්‍ර 1 - අන්‍යෝන්‍ය ලෙස ක්‍රියා කිරීම

1.1 මූලධර්මය : රැකවරණ සපයන්නන් සහ සම්බන්ධීකරණ ඒකක කාර්ය මණ්ඩලය සියළුම ළමුන් සමග අන්‍යෝන්‍ය වශයෙන් ක්‍රියා කරන්නේ උණුසුම්, මිත්‍රශීලී සහ ගෞරවනීය ආකාරයකටය.

1.2 මූලධර්මය : සම්බන්ධීකරණ ඒකක කාර්ය මණ්ඩලය සහ පවුල් අතරේ සන්නිවේදනය ඵලදායක වන අතර ළමුන්ව රැකවරණවල තැබීම පහසු කරවයි.

1.3 මූලධර්මය : රැකවරණ සපයන්නන් සහ පවුල් අතරේ සන්නිවේදනය ඵලදායක වන අතර රැකවරණවලට පුරුදුවීමට පවුලට සහ ළමයා හට උපකාර වනු ඇත.

1.4 මූලධර්මය : රැකවරණ සපයන්නන්ගේ පුද්ගලික සහ පවුල් සූදානම් කිරීම් මගින් පවුල් දිවා රැකවරණ සැපයීම උපකාර කරන යහපත් නිවාස පරිසරයක් ඇති කරයි.

1.5 මූලධර්මය : වැඩ සටහන (scheme) තුල සම්බන්ධතාවයන් මගින් විවිධත්වය, කණ්ඩායම් වැඩ, අන්‍යෝන්‍ය ගරුත්වය, අවබෝධය සහ වෘත්තීයමයභාවය අගය කෙරේ.

## ගුණාත්මක ක්ෂේත්‍ර 2 - භෞතික පරිසරය

2.1 මූලධර්මය : රැකවරණ සපයන්නන්ගේ නිවෙස්වල සහ නිවසින් පිටත ප්‍රදේශවල නිවෙස් සහ ක්‍රීඩා සැසි* ස්ථාන සිත් ගන්නා සුළු, පහසු සහ ළමුන් හට මිත්‍රශීලීවේ.

2.2 මූලධර්මය : උනන්දුව ඇති කරන භාණ්ඩ සහ උපකරණ රාශියකට ළමුන් හට ප්‍රවේශය ඇත

2.3 මූලධර්මය : සම්බන්ධීකරණ ඒකකය විසින් භාවිත කරන පහසුකම් සිත් ගන්නා සුළු අතර පහසුවෙන් ප්‍රවේශ විය හැක

## ගුණාත්මක ක්ෂේත්‍ර 3 - ළමුන්ගේ අත්දැකීම්, ඉගෙනීම සහ වර්ධනය

3.1 මූලධර්මය : ගෘහස්ථ පරිසරයක ඉගෙනීමට උපකාරී වන ආකාරයේ ළමුන්ගේ උවමනාවන් සහ හැකියාවන් කෙරෙහි රැකවරණ සපයන්නන් ප්‍රතිචාර දක්වයි

3.2 මූලධර්මය : සම්බන්ධීකරණ ඒකක කාර්ය මණ්ඩලය විසින් නිවෙස්වලට යාම සහ ක්‍රීඩා සැසි මගින් ළමුන්ගේ ඉගෙනීමට උපකාර කෙරේ

3.3 මූලධර්මය : රැකවරණ සපයන්නන් සහ සම්බන්ධීකරණ ඒකක කාර්ය මණ්ඩලය විසින් ළමුන්ගේ හැසිරීම සක්‍රිය ලෙස හසුරුවනු ලැබේ

3.4 මූලධර්මය : රැකවරණ සපයන්නන් සහ සම්බන්ධීකරණ ඒකක කාර්ය මණ්ඩලය විසින් සියළු ළමුන්ගේ නම්‍යශීලීභාවය සහ සමාජ හැකියාවන් ප්‍රවර්ධනය කෙරේ

3.5 මූලධර්මය : රැකවරණ සපයන්නන් සහ සම්බන්ධීකරණ ඒකක කාර්ය මණ්ඩලය විසින් සියළු ළමුන්ගේ භෞතික හැකියාවන් ප්‍රවර්ධනය කෙරේ

3.6 මූලධර්මය : රැකවරණ සපයන්නන් සහ සම්බන්ධීකරණ ඒකක කාර්ය මණ්ඩලය විසින් සියළු ළමුන්ගේ භාෂාවන්, සාක්ෂරතාව, කුතුහලය, ගණිතාත්මක ලෙස සිතීම සහ විද්‍යාත්මක ගවේෂණය පෝෂණය කෙරේ

3.7 මූලධර්මය : රැකවරණ සපයන්නන් සහ සම්බන්ධීකරණ ඒකක කාර්ය මණ්ඩලය විසින් සියළු ළමුන්ගේ නිර්මාණාත්මක ප්‍රකාශනයට උපකාර ලබාදේ

*FDCQA අරමුණු සඳහා, "ක්‍රීඩා සැසිය" යන්නෙන් රැකවරණ සපයන්නන් දෙදෙනෙකු (හෝ වැඩි සංඛ්‍යාවක්) එකට එකතුවී ළමුන් සමග ළමුන් අරමුණු කරගත් ක්‍රීඩා අත්දැකීම්වල යෙදීමයි. රැකවරණ සපයන්නන් විසින්ම හෝ සම්බන්ධීකරණ ඒකක කාර්ය මණ්ඩලය විසින් ක්‍රීඩා සැසි සංවිධානය කල හැක

## ගුණාත්මක ක්ෂේත්‍ර 4 - සෞඛ්‍යය, සනීපාරක්ෂාව, පෝෂණය, ආරක්ෂාව සහ මනා පැවැත්ම

4.1 මූලධර්මය : ළමුන් හට ලබාදෙන පරිසරය ආරක්ෂාකාරීවේ

4.2 මූලධර්මය : ආහාර සහ පානයන් පෝෂ්‍යදායක වන අතර සංස්කෘතික වශයෙන් යෝග්‍යවේ

4.3 මූලධර්මය : සියළු ළමුන්ගේ සෞඛ්‍යය සහ ආරක්ෂාව සලසනු ලැබේ

4.4 මූලධර්මය : නැපී මාරුව, වැසිකිළි යාම සහ නෑම ළමුන් හට වැඩදායී අත්දැකීම්වේ

4.5 මූලධර්මය : විවේක ගැනීම, නිදා ගැනීම සහ සුවපහසුවෙන් සිටීම වැනි ළමුන්ගේ අවශ්‍යතා හට සහාය ලබාදේ

4.6 මූලධර්මය : ළමා ආරක්ෂාව සහ මනා පැවැත්ම සම්බන්ධව වර්තමානයේ පවතින ප්‍රාන්ත ව්‍යවස්ථාවන් ඒකාකාරී ලෙස ක්‍රියාත්මක කෙරේ

## ගුණාත්මක ක්ෂේත්‍ර 5 - රැකවරණ සපයන්නන් සහ සම්බන්ධීකරණ ඒකක කාර්‍ය මණ්ඩලය

5.1 මූලධර්මය : රැකවරණ සපයන්නන් සහ සම්බන්ධීකරණ ඒකක කාර්‍ය මණ්ඩල අළුතින් බඳවා ගැනීම, තෝරා ගැනීම සහ පුහුණු කිරීමේ කාර්‍යාවලිය මගින් ගුණාත්මක සේවාවක් සැපයීමට උනන්දු කරන අතර ඒ සඳහා සහාය ලබාදේ

5.2 මූලධර්මය : වර්තමාන පරිචය අධීක්ෂණය කිරීම සහ අඛණ්ඩ වර්ධනයන් සිදුකල යුතු ක්ෂේත්‍රයන් හඳුනා ගැනීම සඳහා වැඩ සටහන (scheme) තුල ක්‍රමානුකූල කාරයාවලියක් පවතී

5.3 මූලධර්මය : රැකවරණය සපයන්නන්, සම්බන්ධීකරණ ඒකක කාර්‍ය මණ්ඩලය සහ කළමණාකරණයට හවුල් වෙනත් අය විසින් වෘත්තීය සංවර්ධන අවස්ථා වෙත ප්‍රවේශය ලබා ගනී

5.4 මූලධර්මය : වැඩ සටහන (scheme) මගින් වෘත්තීයමය සෞඛ්‍යය සහ ආරක්ෂාව ප්‍රවර්ධනය කෙරේ

## ගුණාත්මක ක්ෂේත්‍ර 6 - කළමණාකරණය සහ පරිපාලනය

6.1 මූලධර්මය : කළමණාකරණ පරිචයන් සදාචාරාත්මක වන අතර අදාල ව්‍යවස්ථාවන් තුල ක්‍රියාත්මකවේ

6.2 මූලධර්මය : වැඩ සටහන (scheme) සියළු හවුල් කරුවන්ගෙන් අදහස් විමසන අතර ඔවුන් සමග සහයෝගයෙන් කටයුතු කෙරේ

6.3 මූලධර්මය : වාර්තා කළමණාකරණය සඳහා වැඩ සටහන (scheme) තුල කාර්‍යක්ෂම, සඵල සහ ආචාර ධර්ම ක්‍රමයක් ඇත

6.4 මූලධර්මය : සරල සහ පාරදෘශ්‍යවූ, මැසිවිලි සහ පැමිණිලි සලකා බැලීමේ ක්‍රියා පටිපාටියක් වැඩ සටහන (scheme) තුල ඇත

6.5 මූලධර්මය : රැකවරණ සපයන්නන් සහ සම්බන්ධීකරණ ඒකක කාර්‍ය මණ්ඩලය විසින් සිය සේවා සම්බන්ධයෙන් ප්‍රජාව තුල සඵල ලෙස නියෝජනයක් සිදු කරන අතර, ළමුන් සහ ඔවුන්ගේ පවුල් සඳහා වාසි ලබා ගත හැකි වෙනත් ආයතන සමග සක්‍රීය ලෙස සම්බන්ධතා ඇතිකර ගැනීමට කටයුතු කෙරේ

## ප්‍රතිත තීරණ සමාලෝචන කමිටුව (The Accreditation Decisions Review Committee (ADRC))

NCAC විසින් ගනු ලැබූ තීරණ විමර්ශනය සම්බන්ධයෙන් ප්‍රතිත සමාලෝචන කමිටුව (The Accreditation Decisions Review Committee (ADRC)) වගකිව යුතුය. ADRC හි සාමාජිකයන් පත් කරනු ලබන්නේ ළමා රැකවරණ සම්බන්ධව වගකීම ඇති මධ්‍යම රජයේ අමාත්‍යවරයා විසිනි. ADRC ස්වාධීනව කටයුතු කරන අතර, NCAC වෙත නිර්දේශ ඉදිරිපත් කෙරේ.

වැඩ සටහනක් (Scheme) විසින් සිය ප්‍රතිත තීරණයක් සමාලෝචනය කිරීම සඳහා ADRC වෙත අයදුම් කල හැක. වැඩ සටහනක් (Scheme) ප්‍රතිත කිරීමේ තීරණයක් සමාලෝචනය කිරීමේදී, වැඩ සටහන (Scheme) මගින් සමාලෝචනය සඳහා කරන ඉල්ලීමෙහි සඳහන් ලිඛිත තොරතුරු සහ ප්‍රතිත සම්බන්ධ මුල් තීරණයේදී NCAC විසින් සැලකිල්ලට ගනු ලැබූ සියළු තොරතුරු  ADRC විසින් සැලකිල්ලට ගනු ලැබේ. අවසාන තීරණය සම්බන්ධයෙන් NCAC විසින් වැඩ සටහන (Scheme) වෙත ලිඛිතව දැනුම් දෙන අතර ADRC හි නිර්දේශයන්ගේ පිටපතක් ඇතුලත් කරනු ඇත.

ADRC සම්බන්ධ වැඩිදුර විස්තර සහ ප්‍රතිත තීරණයක් සමාලෝචනය කිරීම සඳහා ඉල්ලීම සම්බන්ධ විස්තර NCAC වෙත දුරකථනයෙන් කථා කිරීම මගින් හෝ NCAC වෙබ් අඩවිය (www.ncac.gov.au) වෙතින් ලබා ගත හැක.

## ළමා රැකවරණ ප්‍රතිලාභ (Child Care Benefit) සඳහා අරමුදල් සැපයීම සහ FDCQA හි සාර්ථක (Satisfactory) සහභාගීත්වය සහ ප්‍රගතිය

ළමා රැකවරණ ප්‍රතිලාභ (Child Care Benefit) සඳහා අඛණ්ඩව අනුමැතියට සුදුසුකම් ලැබීමට නම්, පවුල් දිවා රැකවරණ සේවා විසින් නව බදු ක්‍රමයක් (පවුල් සහාය) පරිපාලන පනත 1999 (*A New Tax System (Family Assistance) Administration Act 1999*) යටතේ කරන ලද ළමා රැකවරණ ප්‍රතිලාභ (අනුමැතිය සහ අඛණ්ඩ අනුමැතිය සඳහා ළමා රැකවරණ සේවා සුදුසුකම් ලැබීම) 2001 සංශෝධන තීරණ (අංක 1) (*Child Care Benefit (Eligibility of Child Care Services for Approval and Continued Approval) Amendment Determination 2001* ) *(No. 1)*) අනුව කටයුතු කල යුතුය.

පවුල් දිවා රැකවරණ සේවා සඳහා අඛණ්ඩ අනුමැතිය යන්නට *Quality Practices Guide* (2004) හි සඳහන් ගුණාත්මක ක්ෂේත්‍රයන් සහ මූලධර්මවලට අනුකූල රැකවරණ මට්ටම අඛණ්ඩව වැඩි දියුණු කිරීම ඇතුළුව, FDCQA හි පස් පියවර ක්‍රියාවලියේ අවශ්‍යතාවයන්ට අනුව කටයුතු කිරීම සහ වඩා හොඳ තත්වයේ ළමා රැකවරණ පවත්වා ගෙන යාමට ඇති කැපකිරීම ප්‍රදර්ශනය විය යුතුය.

ළමා රැකවරණ ප්‍රතිලාභ (අඛණ්ඩ අනුමැතිය සඳහා කොන්දේසි කඩකිරීම) සංශෝධන තීරණ 2001 (අංක 1) (*Child Care Benefit (Breach of Conditions for Continued Approval) Amendment Determination 2001 (No.1)*) ට අනුව ප්‍රමිතීන් සපුරාලීමට හෝ FDCQA මගින් සතුටුදායක ප්‍රගතියක් පෙන්වීමට අපොහොසත් වන සේවා, ළමා රැකවරණ ප්‍රතිලාභ (Child Care Benefit) පරිපාලනය සම්බන්ධයෙන් වගකිවයුතු ඕස්ට්‍රේලියානු රජයේ දෙපාර්තමේන්තු වෙත වාර්තා කිරීමට NCAC හට හැකිය.

FDCQA සපුරාලීමට අසමත්වූනු සේවාවක් හට දෙපාර්තමේන්තු ලේකම් විසින් සම්බාධක පැමිණවිය හැක. සම්බාධක අතරට සේවාවේ ළමා රැකවරණ ප්‍රතිලාභ (Child Care Benefit) අනුමැතිය අත්හිටුවීම හෝ අවලංගු කිරීම ඇතුලත් විය හැක. සේවාවේ ළමා රැකවරණ ප්‍රතිලාභ (Child Care Benefit) අනුමැතිය අත්හිටුවීමට හෝ අවලංගු කිරීමට යටත්වූ සේවාවන් හට ක්‍රියාකාරී සහාය (Operational Assistance) සඳහා ඇති හිමිකමද අහිමිවේ.

## FDCQA සහ බලපත්‍ර කිරීමේ ව්‍යවස්ථා

ඕස්ට්‍රේලියාවේ කුමන පවුල් රැකවරණ ප්‍රතිලාභ වැඩ සටහන් (schemes) සඳහා බලපත්‍ර ලබා ගත යුතුද යන්න සම්බන්ධයෙන් ව්‍යවස්ථා පැනවීමේ වගකීම ඇත්තේ ප්‍රාන්ත රජයන් වෙතය. පවුල් දිවා රැකවරණ සඳහාවූ ජාතික ප්‍රමිතීන් 1997 දී වර්ධනය කර මධ්‍යම රජය සහ ප්‍රාන්ත රජයන් ඒ සම්බන්ධයෙන් ඒකගතාවයකට පැමිණි අතර පසුව 1999 දී සංශෝධනයට ලක් කරන ලදී. පවුල් දිවා රැකවරණ සඳහාවූ ජාතික සම්මතයන්* ගේ අරමුණ වන්නේ පවුල් දිවා රැකවරණ ලියාපදිංචිය සම්බන්ධයෙන් ඒකාකාරී ජාතික පදනමක් ඇති කිරීමය.

පවුල් දිවා රැකවරණ සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ රෙගුලාසි ඇති ප්‍රාන්තයන්හි, බලපත්‍ර මගින් සිදු කරනුයේ ඕනෑම වැඩ සටහනක් (scheme) හෝ රැකවරණ සපයන්නකු විසින් ක්‍රියාත්මක විය යුතු අවම නෛතික 'මට්ටමක්' ඇති කිරීමවේ. මෙයට දර්ශීය වශයෙන් ඇතුලත් වන්නේ ඉඩකඩ, තිබෙන උපකරණ ප්‍රමාණය, ළමුන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ වයස්, වැඩ සටහන් (scheme) කාර්ය මණ්ඩල සංඛ්‍යාව සහ පෙර ළමාවිය සම්බන්ධව ඔවුනට ඇති පුහුණුව ආදී පහසුවෙන් මැනිය හැකි සාධකයන්ය. මෙම සාධකයන් ගුණාත්මකභාවයට දායකවේ. ගුණාත්මකභාවය තීරණය වන සාධකයන් දෙස බැලීමට FDCQA මගින් මේවා වර්ධනය කෙරේ. FDCQA හි අවධානය ඇත්තේ රැකවරණය සපයන්නන් සහ කාර්ය මණ්ඩලයේ පරිචයන් සහ ළමුන් සඳහා සත්‍ය වශයෙන් ඇතිවන ප්‍රථිඵලවේ. අවම ප්‍රමිතීන් තිබීම සිට නිරන්තරයෙන් වඩා ඉහල මට්ටම්වල රැකවරණ කරා ලඟාවීම වෙත එහි අවධානය වෙනස් වී ඇත.

FDCQA හි සහභාගිවන වැඩ සටහනක් (scheme) සම්බන්ධ බලපත්‍ර හෝ ළමා ආරක්ෂාව සම්බන්ධ ප්‍රශ්නයක් ඇති බවට NCAC වෙත වාර්තාගත වූ විට අදාල අධිකාරීන් සමග සන්නිවේදනයක් සිදුවනු ඇත. අදාල අධිකාරීන් විසින් මෙම ගැටළු නිරාකරණය වී ඇති බව සනාථ කරමින් උපදෙස් ලබාදුන් විට මෙම බලපත්‍ර හෝ ළමා ආරක්ෂාව සම්බන්ධ ප්‍රශ්න නිරාකරණය වී ඇති බවට NCAC විසින් සලකනු ලැබේ. FDCQA හි වැඩ සටහනක (scheme) ප්‍රගතියට බලපත්‍ර හෝ ළමා ආරක්ෂාව සම්බන්ධ ප්‍රශ්න නිරාකරණයවී නොතිබීම බලපෑ හැක.

පවුල් දිවා රැකවරණ සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ රෙගුලාසි නැති ප්‍රාන්තයන්හි, පවුල් දිවා රැකවරණ සඳහාවූ ජාතික ප්‍රමිතීන්* මගින් සිදු කරනුයේ ඔවුන්ගේ රැකවරණයෙහි සිටින ළමුන්ගේ ආරක්ෂාව සහ සුරක්ෂිතභාවය තහවුරු කිරීම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය අවම සම්මතයන් සැපයීමවේ. කරුණාකර පවුල් සහ ප්‍රජා සේවා දෙපාර්තමේන්තුවේ (FaCS) ළමා රැකවරණ සේවා *Handbook* (FaCS වෙබ් අඩවිය http://www.facs.gov.au/childcare මගින් ප්‍රවේශ විය හැක) බලන්න.

## FDCQA සහ NCAC වෙත ලැබෙන පවුල් දිවා රැකවරණ වැඩ සටහන් (Schemes) සම්බන්ධ පැමිණිලි

NCAC හි වගකීමේ අංගයක් වශයෙන් ඒ මගින් FDCQA හි සහභාගි වන වැඩ සටහන් (schemes) සම්බන්ධ පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කරයි. NCAC විසින් පිළිගනු ලබන ආකාරයට බොහෝමයක් ගැටළු සහ ප්‍රශ්න ඍජුවම අදාල වැඩ සටහන් (schemes) හා සම්බන්ධවීම මගින් විසඳා ගත හැක. ඕනෑම ගැටළුවක්, දුක් ගැනවිල්ලක් හෝ පැමිණිල්ලක් සම්බන්ධව කටයුතු කිරීම සඳහා පැහැදිලි ක්‍රියා පටිපාටීන් වර්ධනය කිරීම සහ ඒකාකාරී ලෙස ක්‍රියාත්මක කිරීමට FDCQA හි සහභාගි වන වැඩ සටහන් (schemes) දිරිමත් කෙරේ. සිය ගැටළු සම්බන්ධව වැඩ සටහන් (schemes) රැකවරණය සපයන්නන් සහ කාර්‍යය මණ්ඩලය සමග සාකච්ඡා කිරීමට පැමිණිලි කරුවන්ව NCAC මගින් දිරිමත් කෙරේ.

ලිඛිත පැමිණිල්ල මගින් මතුකල ගැටළු සම්බන්ධයෙන් NCAC විසින් අදාල වැඩ සටහන (schemes) වෙත දැනුම්දේ. ප්‍රාන්ත බලපත්‍ර රෙගුලාසි හෝ ළමා ආරක්ෂාව සම්බන්ධව වැඩ සටහනක (scheme) පරිචයන් සම්බන්ධව තොරතුරු ලැබුණු විට, මෙම කරුණු සම්බන්ධව NCAC විසින් ප්‍රාන්ත බලපත්‍ර අධිකාරියට හෝ වෙනත් අදාල අධිකාරිය වෙත මෙම තොරතුරු ලබාදේ.

පවුල් රැකවරණ වැඩ සටහන් (schemes) සම්බන්ධ පැමිණිලි සමථයට පත්වූ ලෙස සලකන්නේ ගැටළුව සම්බන්ධව වැඩ සටහනේ (scheme) ප්‍රතිචාරය ප්‍රමාණවත්වූ අවස්ථාවල සහ අවස්ථානුකූලව අදාල අධිකාරිය විසින් බලපත්‍ර හෝ ළමා ආරක්ෂාව පිළිබඳ ගැටළු සමථයකට පත්ව ඇතිබවට සනාථ කරන උපදෙස් ලබාදීමෙන් අනතුරුවය.

පැමිණිල්ලේ මතුකල ගැටළු නිරාකරණය නොවී තිබෙන බවට NCAC විසින් සලකනු ලබන්නේ නම් FDCQA තුල වැඩ සටහනේ (scheme) ප්‍රගතියට බලපෑම් ඇතිවිය හැක.

## ජාතික ළමා රැකවරණ ප්‍රතිත කවුන්සිලය (National Childcare Accreditation Council Inc (NCAC)) සම්බන්ධව

ඕස්ට්‍රේලියාව පුරා දීර්ඝ දිවා ළමා රැකවරණ මධ්‍යස්ථාන සඳහා තත්ව වැඩි දියුණු කිරීම සහ ප්‍රතිත ක්‍රම (Quality Improvement and Accreditation System (QIAS)) ක්‍රියාත්මක කිරීම සඳහා 1993 දී NCAC ස්ථාපනය කරන ලදී. 2001 සහ 2003 වසර වලදී NCAC වගකීම් අතරට ඕස්ට්‍රේලියාවේ පවුල් දිවා රැකවරණ වැඩ සටහන් (scheme) පරිපාලනය සඳහා පවුල් දිවා රැකවරණ තත්ව තහවුරු (Family Day Care Quality Assurance (FDCQA)) ක්‍රමයද, පාසැල් වේලාවෙන් පිටත රැකවරණ සේවා සඳහා පාසැල් වේලාවෙන් පිටත රැකවරණ තත්ව තහවුරු (Outside School Hours Care Quality Assurance (OSHCQA)) ක්‍රමයද ඇතුළු විය. NCAC හට අරමුදල් ලැබෙන්නේ මධ්‍යම රජයෙන් වන අතර ළමා රැකවරණ සම්බන්ධ වගකීම ඇති මධ්‍යම රජයේ අමාත්‍යවරයා විසින් සභාපතිවරයා සහ සාමාජිකයන් පත්කරනු ලැබේ.

NCAC යනු ජාතික සංවිධානයක් වන අතර ප්‍රාන්තයන්හි වෙසෙන ළමා රැකවරණ වෘත්තීය සහ අදාල ක්ෂේත්‍රයන්හි නිරතවූ අය අතරින් සාමාජිකයන් පත් කෙරේ.

ඕස්ට්‍රේලියාවේ ළමා සේවාවල සපයනු ලබන ළමා රැකවරණවල ගුණාත්මකභාවය වර්ධනය කිරීමටත් ඕස්ට්‍රේලියාවේ සියළුම ළමුන් උසස් තත්වයේ රැකවරණ ලබන බවට වගබලා ගැනීමට අවශ්‍ය උපදෙස් ළමා රැකවරණ සපයන්නන් සහ පවුල් හට ලබා දීමත් NCAC හි අපේක්ෂාවන්වේ.

NCAC හි කාර්‍යයන් අතරේ FDCQA හි සහභාගිවන ඕස්ට්‍රේලියානු පවුල් දිවා රැකවරණ යෝජනා ක්‍රම (schemes), OSHCQA හි සහභාගි වන ඕස්ට්‍රේලියානු පාසැල් වේලාවෙන් පිටත රැකවරණ සේවාවන් සහ QIAS හි සහභාගි වන ඕස්ට්‍රේලියානු දීර්ඝ දිවා රැකවරණ ප්‍රතිත කිරීමත් ; FDCQA හි පවුල් දිවා රැකවරණ, OSHCQA හි සේවාවන් සහ QIAS හි මධ්‍යස්ථානවල සහභාගිත්වය සහ ප්‍රගතිය සම්බන්ධව මධ්‍යම රජයට උපදෙස් ලබා දීම ඇතුලත්වේ.

NCAC හි අරමුණු සහ කැපවීම ගනුදෙනුකාර සේවා ආචාර ධර්ම පද්ධතියෙහි (*Customer Service Charter*) දක්වා ඇත. NCAC හට දුරකථනයෙන් ඇමතීම මගින් හෝ වෙබ් අඩවියට (www.ncac.gov.au) ප්‍රවේශ වීම මගින් මෙම තොරතුරු ලබා ගත හැක.

## තවත් තොරතුරු

FDCQA ගුණාත්මක දර්ශකයන් සහ ප්‍රතිත සඳහා අවශ්‍ය සම්මතයන් සම්බන්ධ තොරතුරු ලබා ගැනීම සඳහා කරුණාකර FDCQA *Quality Practices Guide* (2004) බලන්න. එසේ නොමැතිනම් NCAC වෙබ් අඩවිය වෙත යන්න.

FDCQA *Handbook* (2004), FDCQA *Quality Practices Guide* (2004), FDCQA *Self-study Report* (2004) සහ FDCQA *Validation Report* (2004) NCAC වෙතින් මිලට ගත හැක.